2.1.1 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 21/2013 ප්‍රකාරව අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීම් වාර්ෂිකව අයවැය ඇස්තමේන්තු මගින් වෙන් කරනු ලබන ප්‍රතිපාදන සීමාව තුල කලමනාකරණය කර ගත යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2022 හි 3(XIII) ඡේදය අනුව අතිකාල ගෙවීම් පාලනය කරගැනීම කල යුතු නමුත් ඊට අනුකූල නොවන ලෙස වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් 276-1-1-0-1002 වැය විෂය සඳහා වෙන් කරන ලද රු.23,000,000 ක ප්‍රතිපාදනයට අමතරව මුදල් රෙගුලාසි 66 යටතේ රු.500,000 ක ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්ගෙන් මාරුකර ගෙන තිබුණි.

2.1.2 යම් කිසි වැය විෂයයක් සඳහා ප්‍රතිපාදන සලසනු ලබන්නේ ඒ යටතේ වියදම් දැරීමේ අපේක්ෂාවෙන් කරනු ලබන ප්‍රතිපාදන ඉල්ලීම් සැලකිල්ලට ගෙන වුවද වැය විෂයයන් 05 ක් සඳහා වෙන් කරන ලද රු.94,800,000 ක ප්‍රතිපාදනවලින් සියයට 8 සිට 83 දක්වා ප්‍රතිශතයක් වෙනත් වැය විෂයයන්ට මාරුකර තිබුණි.

2.1.3 තාත්වික ලෙස ඇස්තමේන්තු සකස් නොකිරීම හේතුවෙන් වැය විෂයයන් 09 ක් සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් සලසා තිබූ රු.107,590,000 ක ප්‍රතිපාදනවලට අමතරව රු.13,875,000 ක් වූ ප්‍රතිපාදන මුදල් රෙගුලාසි 66 යටතේ වෙනත් වැය විෂයයන්ගෙන් මාරු කරගෙන තිබුණි

2.1.4 මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව වියදම් ශීර්ෂයක් තුල වැඩසටහනක්, ව්‍යාපෘතියක්, වැය විෂයයක් හෝ වැය විෂයයන් සඳහා ඇස්තමේන්තුවල වෙන්කර ඇති මූල්‍ය ප්‍රතිපාදන මුදල් වර්ෂය තුල වියදම් කිරීමට ප්‍රමාණවත් නොවන බව හා එම ප්‍රතිපාදනවල සීමාව ඉක්මවා යෑමට ඉඩ ඇති බව පෙනී යන විට පමණක් යම් වැඩසටහනක, ව්‍යාපෘතියක හෝ වැය විෂයයක ඉතිරි කිරීම් මාරු කරගැනීමට කටයුතු කල යුතු වුවද, වැය විෂයයන් 05 ක් සඳහා මාරුකර ගත් රු.7,100,000 ක ප්‍රතිපාදන වලින් සියයට 18 සිට 100 ක් වූ ප්‍රතිශතයක් උපයෝජනය කර නොතිබුණු අතර 276-1-1-0-1002 වැය විෂයයට මුදල් රෙගුලාසි 66 යටතේ මාරු කරගත් ප්‍රතිපාදනය මෙන් සියයට 560 ක් ඉතිරි වී තිබුණි.

2.1.5 2022 අප්‍රේල් 26 දිනැති 03/2022 චක්‍රලේඛයේ උපදෙස් පිළිබඳ අනවධානයෙන් යුතුව හා රටේ පවතින ආර්ථික අර්බුදය පිළිබඳව සැලකිලිමත් වීමකින් තොරව, 2022 සැප්තැම්බර් මස 09 වන දින අනුමත කරන ලද 2022 අංක 21 දරන (සංශෝධිත) විසර්ජන පනත මගින් රු.545,000,000ක් අංක 2509 දරන වෙනත් මූලධන වියදම් වැය විෂයය සඳහා ප්‍රතිපාදන වෙන්කර ගෙන තිබුණු බව නිරීක්ෂණය වූ අතර 2022 දෙසැම්බර් 31 දින වන විට එම ප්‍රතිපාදන වලින් සියයට 41 ක් එනම් රු.223,757,568 ක් අතාත්වික ලෙස අයවැය ඇස්තමේන්තු සකස් කිරීම හේතුවෙන් ඉතිරි වී තිබුණි.

2.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

2.2.1 සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය හා ව්‍යාපාර ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත රු.8,467,274 ක් වැයකර මහියංගණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කෘෂි, සත්ව පාලන, කර්මාන්ත, අලෙවි හා සේවා ආදී වශයෙන් ව්‍යාපෘති 205 ක් ක්‍රියාත්මක කර තිබුණි. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2021 පෙබරවාරි 22 දිනැති සමෘද්ධි චක්‍රලේඛ අංක 2021/05 අනුව සවිබල ගැන්විය හැකි හා සවිබල ගැන්වීම කෙරෙහි දැඩි උනන්දුවක් දක්වන ප්‍රතිලාභීන් ව්‍යාපෘතිය සඳහා තෝරාගත යුතුව පැවතුණු නමුත් ගවගාල්, කුකුල් කූඩු ඉදිකිරීම සඳහා ද්‍රව්‍යාධාර ලබාදුන් ඇතැම් ප්‍රතිලාභීන් එම ඉදිකිරීම් සිදුකර නොතිබුණි. ලබාදුන් සෙවිලි තහඩු මුළුතැන්ගෙය, වැසිකිලිය ආදිය සෙවිලි කිරීම සඳහා යොදාගෙන තිබුණි. තවද රු.453,750 ක් වැය කර මිලදී ගෙන තිබුණු සෙවිලි තහඩු ව්‍යාපෘතියේ ඉදිකිරීම් වලට යෝග්‍ය වූ ප්‍රමිතියෙන් යුතු ඒවාද යන්න හඳුනා නොගෙන ගේජ් 34 සෙවිලි තහඩු මිලදී ගෙන තිබුණු අතර ඇතැම් ප්‍රතිලාභීන්ට ලබාදී තිබුණු සෙවිලි තහඩු විගණිත දිනය වූ 2022 ඔක්තෝබර් 20 දින වන විටත් ඉරී ගොස් පැවතුණි.

2.2.2 ග්‍රාමීය පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයේ රු.6,000,000 ක ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කල ඇස්තමේන්තුගත වටිනාකම (ද්‍රව්‍ය) රු.5,636,026 ක් වූ බණ්ඩාරවෙල මධ්‍ය මහා විද්‍යාලයේ ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය 2021 දෙසැම්බර් 31 දිනට නිමකල යුතු වුවද 2022 අගෝස්තු වන විටද වැඩ නිමකර නොතිබුණි. නියමිත කාලරාමුව තුල ප්‍රසම්පාදන කටයුතු හා ඉදිකිරීම් කටයුතු සිදු නොකිරීම හේතුවෙන් ව්‍යාපෘතිය සඳහා වූ ද්‍රව්‍ය ඇස්තමේන්තුවෙන් සියයට 55 ක ප්‍රමාණයක් මිලදි ගැනීම සඳහා පමණක් රු.5,539,696 ක මුදලක් වැය කර තිබුණු අතර 2022 දෙසැම්බර් 31 දින වන විට ඇස්තමේන්තුගත වැඩ ප්‍රමාණයෙන් සියයට 66 ක ප්‍රමාණයක් පමණක් නිමකර තිබුණි.

2.2.3 හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් හින්දු කෝවිල් ප්‍රතිසංස්කරණය සඳහා 2020 වර්ෂයේ අවස්ථා 03 කදී ඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලබාදී තිබුණු රු.570,000 ක මුදලක් අදාල ව්‍යාපෘති ඉටු නොකර සමාලෝචිත වර්ෂය තුල ආපසු එම දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර තිබුණි.

2.2.4 මහියංගණය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ උල්හිටිය ජලාශය ආශ්‍රිතව මිරිදිය මත්ස්‍ය නිෂ්පාදන ගම්මාන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර රාජ්‍ය අමාත්‍යාංශය විසින් රු.11,777,735 ක ප්‍රතිපාදන ලබා තිබියදී ඉන් රු.9,755,348 ක ප්‍රතිපාදන ඉතිරිකර, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

2.2.5 ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ 2014 වර්ෂයේ පළාත් නැගුම සංවර්ධන වැඩසටහන යටතේ හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක කල උස්සැල්ල සායන මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු.1,773,300 ක් වැය කර තිබුණු අතර ඉදිකිරීමෙන් පසු ගොඩනැගිල්ල සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත භාරදී නොතිබුණි. 2023 මාර්තු 31 දින වන විටද ගොඩනැගිල්ල සායන කටයුතු සඳහා භාවිතයට නොගෙන නිශ්කාර්යව පැවතුනි.

2.3 ගණන් දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතික වීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන් දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබූ නමුත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත් එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.4 නීති,රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල වීම් නිරීක්ෂණය විය.

	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම
(අ)	ව්‍යවස්ථාපිත විධිවිධාන	
	1982 අංක 43 දරන මුද්දර බදු පනත	සුරාබදු බලපත්‍ර නිකුත් කිරීමේදී අයකරනු ලබන මුද්දර ගාස්තුව අදාල කාර්තුව අවසන් වී ඊලඟ මාසයේ 15 දිනට පෙර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කල යුතු වුවද ඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2020 වර්ෂයේදි අයකර ගන්නා ලද රු.642,000 ක මුද්දර ගාස්තු 2022 සැප්තැම්බර් 09 වන විටද එසේ ප්‍රේෂණය කර නොතිබුණි.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි	
i.	මුදල් රෙගුලාසි 104(3) / 104(4)	බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු කැබ රථය 2022 නොවැම්බර් 01 දින හදිසි අනතුරකට ලක්ව තිබුණු අතර දින 07 ක් තුල ඉදිරිපත් කලයුතු ප්‍රාරම්භක වාර්තාව දින 14 කට පසු ඉදිරිපත් කර තිබුණි. මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාර පරිපූර්ණ වාර්තාව පිලියෙල කර ඉදිරිපත් කිරීම විගණිත දිනවූ 2023 අප්‍රේල් 06 දක්වාම සිදුකර නොතිබුණි.

ii.	රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 න් සංශෝධිත මුදල් රෙගුලාසි 371(2)	යම් නිශ්චිත කාර්යයක් සඳහා දෙන ලද අතුරු අග්‍රිම එම කාර්යය නිමවූ වහාම පියවිය යුතු වුවද දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරීන් අට දෙනෙකු වෙත අවස්ථා 14 කදී දෙන ලද එකතුව රු.232,675 ක්වූ අතුරු අග්‍රිම පියවීමේදී දින 03 සිට දින 43 දක්වා ප්‍රමාදයක් පැවතිනි.
(ඇ)	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ----------	
	රාජ්‍ය පරිපාලන හා කලමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය	සෑම ඉන්ධන පරීක්ෂාවකින් මාස 12 කට පසුව හෝ කිලෝමීටර් 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එයින් මුලින් යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන දහන පරීක්ෂාවක් සිදුකල යුතු වුවද දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක් යටතේ පවතින වාහන 09 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.
(ඈ)	ජාතික අයවැය චක්‍රලේඛ ----------	
	2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ X වගන්තිය	සමාලෝචිත වර්ෂය අවසන් වන තෙක් මාණ්ඩලික නිලධාරීන්ට රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම යටතේ ණය පහසුකම් ලබා නොදිය යුතු වුවත් එයට අනුකූල නොවන පරිදි බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන් දෙදෙනෙකු වෙත සමාලෝචිත වර්ෂය තුලදී එකතුව රු.229,948 ක් වූ ආපදා ණය ලබාදී තිබුණි.
(ඉ)	විශ්‍රාම වැටුප් චක්‍රලේඛ ----------	
	2006 දෙසැම්බර් 15 දිනැති අංක 19/2006 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය	විශ්‍රාමිකයෙකු මියගිය විට දින 07 ක් තුල ග්‍රාම නිලධාරීන් විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දැනුවත් කල යුතු වුවද එසේ දැනුවත් නොකිරීම හේතුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක් මගින් මිය ගිය විශ්‍රාමිකයින් 15 දෙනෙකු සඳහා විශ්‍රාම වැටුප් වශයෙන් රු.628,482 ක් ගෙවා තිබුණි.
(ඊ)	ඒකාබද්ධ සේවයේ නිලධාරීන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තියෙහි 2.2.2 සහ 2.2.3 ඡේදයන්	එක් සේවා ස්ථානයක වසර 05 කට වැඩි කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් ස්ථාන මාරුවීම්වලට යටත් විය යුතු වුවද ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක නිලධාරීන් 245 දෙනෙකු වසර 06 සිට වසර 17 දක්වා කාලයක් එකම සේවා ස්ථානයක සේවය කරමින් පැවතුණි.

2.5 අවධිමත් ගනුදෙනු

හාලිඇල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් ගම සමඟ පිළිසඳර වැඩසටහන යටතේ රු.7,415,103 ක් වැයකර සමාලෝචිත වර්ෂයේ ආරම්භ කරන ලද නමුත් විගණිත දිනය වූ 2022 සැප්තැම්බර් 13 වන විටත් නිම නොකල ව්‍යාපෘති 04 ක් සම්බන්ධයෙන් ඇස්තමේන්තුවේ සඳහන් Building Schedule of Rates අයිතම නිසි පරිදි ඉටුකිරීමකින් තොරව සාවධ්‍ය නිම කිරීමේ සහතික ලබාදීමත්, එම වාර්තා අනුමත කිරීමත්, සාවධ්‍ය මැණුම් වාර්තා සකස් කර බිල්පත් ඉදිරිපත් කිරීමත් සිදුකර තිබුණි.

2.6 තැන්පතු

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

2.6.1 අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක BD/ACC/21/01/03/2020 හා 2020 ජනවාරි 30 දිනැති ලිපියේ උපදෙස් පරිදි රජයේ නිලධාරීන්ට ලබාදී තිබුණු යතුරු පැදි සම්බන්ධයෙන් යතුරු පැදි හිමිකරුවන් විසින් සම්පූර්ණ වෙළඳපොල වටිනාකම ගෙවීමෙන් අනතුරුව භාණ්ඩාගාරය වෙත යැවීම සඳහා 2020 පෙබරවාරි 14 වන දින රිසිට් අංක 475621 මගින් තැන්පත් කරන ලද රු.566,840 ක මුදල තැන්පත් කර වර්ෂ 03 කට ආසන්න කාලයක් ගතවී තිබුණද එම මුදල නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටද කටයුතු කර නොතිබුණි.

2.6.2 අවදානමක් සහිත ගලක් ඉවත් කිරීම සඳහා ගොඩනැගිලි පර්යේෂණ ආයතනය මගින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත 2020 ජූනි 17 දින ලබාදී තිබුණු රු.1,039,615 ක මුදල, හල්දුම්මුල්ල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වෙත නිදහස් නොකර ඉතිරි සියයට 50 ක මුදල ගොඩනැගිලි පර්යේෂණ ආයතනයෙන් ලැබෙන තුරු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණු අතර ඉතිරි සියයට 50 ක මුදල ලබාගැනීමට හෝ අන්‍යාකාරයකින් ප්‍රතිපාදන සලසාගෙන අවදානම් ගල ඉවත් කිරීම සඳහා හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි.

2.6.3 බණ්ඩාරවෙල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වෙත දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ඉදිකිරීම් සඳහා 2019 අගෝස්තු 20 දින ලැබී තිබුණු රු.711,579 ක මුදල අදාල කාර්යය සඳහා යොදා නොගෙන විගණිත දිනය වූ 2022 දෙසැම්බර් 31 දක්වාම පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

2.6.4 2017 ජූලි 29 වන දින අනතුරට පත් රිදීමාලියද්ද ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අයත් වාහනය අළුත්වැඩියා කිරීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සමාගම විසින් 2019 දෙසැම්බර් 20 දින ලබාදී තිබුණු රු.2,470,000 ක මුදල වර්ෂයේ ආදායම් ලැබීම් ලෙස හඳුනා ගැනීම වෙනුවට 2020 ජූනි 25 වන දින පොදු තැන්පත් ගිණුමට බැරකර තිබුණි. නමුත් 2023 මාර්තු 31 දින වන විට ද අදාළ තැන්පතුව නිරාකරණය කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් කටයුතු කර නොතිබුණි.

2.6.5 ඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලය තුල අවස්ථා 09 කදී ආපදා නිවාස හානි ගෙවීම වෙනුවෙන් ආපදා කලමනාකරණ අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු රු.846,557 ක් අදාල පාර්ශවයන් වෙත ගෙවීමට කටයුතු නොකර සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාද තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 සැලසුම් කිරීම

2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කල යුතු අතර ඒ සඳහා භාවිතා කල යුතු ආකෘති පත්‍ර හා දත්ත ඇතුලත් කිරීමේ මාර්ගෝපදේශ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙන් ලබාගත යුතුව තිබුණි. නමුත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්ම පරීක්ෂා කිරීමේදී උක්ත මාර්ගෝපදේශයන්ට අනුකූල නොවන පරිදි කටයුතු කර තිබුණු අවස්ථා 02 ක් නිරීක්ෂණය විය.

3.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

3.1.2.1 වැය විෂයය අංක 2104 යටතේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර තිබුණු මහියංගණ ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල නියමිත පරිදි නිමකර ගැනීමේ කාර්යය 2023 මාර්තු 31 දින වන විටද නිමකර නොතිබුණි.

3.1.2.2 වැය විෂයය අංක 2401 යටතේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර තිබුණු අත්‍යාවශ්‍ය පුහුණු වැඩසටහන් ලෙස හඳුනාගෙන තිබුණු පුහුණු වැඩසටහන් 05 ක් සමාලෝචිත වර්ෂය තුලදී ක්‍රියාත්මක කර නොතිබුණි.

3.1.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

3.1.3.1 බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ මී මැසි ජනපද ඇතිකිරීමේ අරමුණින් රු.1,647,725 ක් වැයකර මී මැසි ජනපද හා උපකරණ මිලදීගෙන තිබුන ද තෝරාගත් ප්‍රතිලාභීන් 33 අතරින් ප්‍රතිලාභීන් 24 දෙනෙකු සඳහා 2023 මාර්තු 31 දින වන විට ද මී මැසි ජනපද ලබා දී නොතිබුණි.

3.1.3.2 කන්දකැටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බොකන් ඔරුව ග්‍රාම නිලධාරී වසමේ ප්‍රතිලාභීන් 50 දෙනෙකු තෝරාගෙන රු.7,081,240 ක් වැය කර පොලිටනල් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබුණද 2023 මාර්තු 31 දින වන විට ව්‍යාපෘතිය ආරම්භ කර වර්ෂයකට වැඩි කාලයක් ගත වුවද ප්‍රතිලාභීන් 41 දෙනෙකු පොලිටනල් ඉදිකර නොතිබීම හේතුවෙන් එම ප්‍රතිලාභීන් වෙනුවෙන් වැයකර තිබුණු රු.4,100,000 ක මුදල අනාර්ථික වියදමක් වී තිබුණි.

3.1.3.3 වැලිමඩ, රිදිමාලියද්ද හා බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සෞභාග්‍ය නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ තෝරාගත් ප්‍රතිලාභීන්ට ලබාදුන් කිකිලි පැටවුන් 16,450 ක ගෙන් කිකිළි පැටවුන් 9504 දෙනෙකු 2022 දෙසැම්බර් 31 දින වන විටද මියගොස් තිබීම හේතුවෙන්, රජය විසින් ඒ සඳහා වැයකල රු.4,181,760 ක මුදල අනාර්ථික වියදමක් වී තිබුණි.

3.1.3.4 පස්සර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සෞභාග්‍ය නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ කිතුල් ආශ්‍රිත නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා රු.1,911,875 ක් වැය කර මිලදී ගෙන තිබුණු ගෑස් ලිප් 161 ක්, ගෑස් සිලින්ඩර් ලබා නොදීම හේතුවෙන් භාවිතයෙන් තොරව 2022 දෙසැම්බර් 31 දින වන විටත් නිශ්කාර්යව තිබුණි. ඒ අනුව තත්ත්වයෙන් උසස් කිතුල් පැණි නිෂ්පාදනය කිරීමේ අපේක්ෂිත අරමුණ ඉටු කරගත නොහැකිව තිබුණි.

3.1.4 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

3.1.4.1 මහියංගණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු.140,961,320 ක ගිවිසුම්ගත මුදලකට 2017 දෙසැම්බර් 18 දින finite lanka ආයතනය සමග ගිවිසුම්ගත වී තිබුණු අතර, 2023 මාර්තු 31 දින වන විට රු.139,444,590 ක් වැයකර තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුම අනුව ගිවිසුම්ගත දින සිට දින 546 කින් වැඩ අවසන් කල යුතු වුවද, 2023 මාර්තු 31 දින වන විටද වැඩ අවසන් කර නොතිබුණි. එදිනට වැඩ ප්‍රමාද කාලය දින 1928 ක් වූ අතර එය ඇස්තමේන්තුගත කාලය මෙන් සිවු ගුණයකට ආසන්න වී තිබුණි.

3.1.4.2 හාලිඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2021 වර්ෂයේ විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ රු.950,000 ක ප්‍රතිපාදන මත උණගොල්ල අහුරුමලේ කොටස රෝහල දක්වා පානීය ජල ව්‍යාපෘතිය ආරම්භ කර 2022 දෙසැම්බර් 31 දින වන විට රු.925,157 ක් වැයකර තිබුණි. ව්‍යාපෘතිය ආරම්භ කර වර්ෂයකට වැඩි කාලයක් ගත වුවද වැඩ නිම කර නොතිබුණි.

3.1.5 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

3.1.5.1 බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ, ඉලුක්තැන්න ග්‍රාම නිලධාරී වසමේ වාණිජ ගම් බිත්තර හා ගම් කුකුළු පැටවු නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා ප්‍රතිලාභීන් 50 දෙනෙකු තෝරාගෙන රු.3,313,706 ක් වැයකර තිබුණු අතර ඉන් ප්‍රතිලාභීන් 22 දෙනෙකුට 2022 සැප්තැම්බර් 17 වන දින වන විටද, කුකුළු පැටවුන් ලබාදී නොතිබුණි. ඉතිරි ප්‍රතිලාභීන්ද ගම් බිත්තර නිෂ්පාදනය කිරීම සුලු මට්ටමින් සිදු කරමින් පැවති අතර එය යැපුම් අවශ්‍යතාවය සඳහාවත් ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය. ඒ අනුව වාණිජ මට්ටමින් ගම් බිත්තර හා කුකුළු පැටවුන් ඇතිකිරීමේ කර්මාන්තය සංවර්ධනය කිරීමේ අරමුණ සඵලදායී ලෙස ලභාකර ගෙන නොතිබුණි.

3.1.5.2 බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ, ඉලුක්තැන්න ග්‍රාම නිලධාරී වසමේ වාණිජ කිර වගා ව්‍යාපෘතිය සඳහා ප්‍රතිලාභීන් 154 දෙනෙකු තෝරාගෙන තිබුණු අතර ඒ සඳහා රු.3,413,756 ක් වැයකර තිබුණි. එයින් ප්‍රතිලාභීන් 34 දෙනෙකු කිර වගාව සිදු නොකරන අතර ඉතිරියෙන් අඩකට වැඩි සංඛ්‍යාවක් යැපුම් මට්ටමින් ගෘහ අවශ්‍යතාවය සඳහා පමණක් කිර වගාව සිදුකරන බැවින් වාණිජ වගාවක් ලෙස කිර වගා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

3.1.6 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කල මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කල යුතු වුවද එම අවශ්‍යතාවයන්ට අනුකූල නොවන ලෙස සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද වාර්ෂික කාර්යසාධන වාර්තාවේ මානව සම්පත් සංවර්ධනයට අදාල තොරතුරු මානව සම්පත් පැතිකඩ යටතේ නියමිත ආකෘති ප්‍රකාරව ඇතුලත් කර නොතිබුණු අතර ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන්වල දායකත්වය පිළිබඳ විස්තර ද මානව සම්පත් පැතිකඩ යටතේ ඇතුලත් කර නොතිබුණි.

3.2 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

3.2.1 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2 ඡේදය අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලියක් මගින් අවම පිරිවැයක් දැරීමේ ප්‍රතිඵලයක් ලෙස උපරිම ආර්ථික වාසි ආයතනයට ලබාගැනීමටත්, උනන්දුවක් දක්වන පාර්ශවයන්ට සාධාරණ හා එක හා සමාන අවස්ථා සලසා දීම තුලින් තරහකාරීත්වයේ වාසි ලබාගැනීමටත් කටයුතු කල යුතු වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක් විසින් 2022 වර්ෂයේදී සිදුකරන ලද රු.2,932,751 ක්වූ ප්‍රසම්පාදන කටයුතු 07 කදී ඉදිරිපත්වූ එකම සැපයුම්කරු තෝරාගැනීම හේතුවෙන් ප්‍රසම්පාදන අරමුණු ලගා කර ගැනීම සඳහා සාධාරණ ලෙස උත්සාහ කර නොතිබුණි.

3.2.2 පස්සර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ කිතුල් ආශ්‍රිත නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා රු.1,867,600 ක් වැයකර පිරිවිතරයන්ට අනුකූල නොවන ලෙස සුදු යකඩ තාච්චි 165 ක් හා මල් මදින පිහි 16 ක් මිලදී ගෙන තිබුණි.

3.3 වත්කම් කලමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

3.3.1 ඇල්ල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් ආර්ථික සංවර්ධන නිලධාරි කාර්යාලය සඳහා ඉදිකරන ලද ගොඩනැගිල්ලක් නිශ්කාර්යව පැවතුණු අතර,මීගහකිවුල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය සතු ප්‍රාදේශිය ලේකම් නිල නිවස සහ සහකාර අධ්‍යක්ෂ සැලසුම් නිල නිවාසය කිසිවෙකුගේ භාවිතයට නොගෙන අබලන්ව පැවතුණි. තවද, ඌවපරණගම ප්‍රාදේශිය ලේකම් කාර්යාලය සතු යතුරුපැදිය 2020 මැයි මාසයෙන් පසු නිශ්කාර්යව පැවති අතර අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට ද කටයුතු කර නොතිබුණි.

3.3.2 කන්දකැටිය හා හල්දුම්මුල්ල ප්‍රාදේශිය ලේකම් කාර්යාල විසින් සුදු ගම්මිරිස් නිෂ්පාදන ව්‍යාපෘති සඳහා 2022 මැයි 20 හා 21 වන දිනවල ස්ථාපිත කරන ලද පිරිවැය රු.4,555,000 ක් වූ ගම්මිරිස් වියලන යන්ත්‍ර 02 ක් 2023 මාර්තු 31 දින වන විටත් භාවිතයෙන් තොරව නිශ්කාර්යව පැවතුණි.

3.3.3 කන්දකැටිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් පොලි ටනල් තුල වගාකරන එලවළු රැස්කිරීම හා සකස් කිරීමේ අරමුණින් රු.1,950,000 ක් වැයකර ඉදිකරන ලද බොකන් ඔරුව බහුකාර්ය ගොඩනැගිල්ල 2023 මාර්තු 31 දින වන විටද භාවිතයට නොගෙන නිශ්කාර්යව පැවතුණි.

3.4 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

3.4.1 වැලිමඩ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් අංක 21-1100013 දරන විශ්‍රාමිකයා 2015 ඔක්තෝබර් 31 දින මිය ගියද විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය යාවත්කාලීන කර නොතිබීම හේතුවෙන් මියයාමෙන් පසුවද 2019 ජූනි 30 දින දක්වා වූ රු.1,412,812 ක් මියගිය විශ්‍රාමලාභියාගේ බැංකු ගිණුමට බැරවී තිබුණු අතර එම මුදල ඔහුගේ උරුමකරුවන් විසින් ලබාගෙන තිබුණි. එයින් රු.850,484 ක මුදලක් 2022 දෙසැම්බර් 31 දින වන විටද නැවත අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි

3.4.2 රිදීමාලියද්ද ප්‍රාදේශිය ලේකම් කාර්යාලය සතු කැබ් රථය 2017 ජූලි 29 දින අනතුරට පත් වී තිබුණු අතර එයින් සිදු වූ රු.6,349,333 ක අලාභයෙන් රු.2,500,000 ක් රක්ෂණය මඟින් ප්‍රතිපූර්ණ කර තිබුණි. 2023 මාර්තු 31 දින වන විටද රක්ෂණය මඟින් ප්‍රතිපූර්ණය නොකල රු.3,849,333 ක අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකරගෙන නොතිබුණි. රක්ෂණ

වන්දි මුදල තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණු අතර රථය අළුත්වැඩියා කිරීමට හෝ සුදුසු පරිදි අපහරණය කිරීමට කටයුතු කිරීමෙන් තොරව කාර්යාල පරිශ්‍රයේ රඳවා තිබුණි.

3.4.3 ඌව පරණගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයක් අනතුරට ලක් වී වර්ෂ 08 කට පසු ඊට අදාල අලාභ හානිය රු.500,000 ක් ලෙස 2019 මැයි 15 දින බදුල්ල දිස්ත්‍රික් තක්සේරුකරු විසින් තක්සේරු කර තිබුණු අතර මු.රෙ 104(4) පරීක්ෂණ වාර්තාව අනුව අනතුර සඳහා වගකිව යුතු පාර්ශවයන්ගෙන් එම අලාභය අයකර ගන්නා ලෙස නිර්දේශ කර තිබුණද 2023 මාර්තු 31 දින වන වන විට ද අලාභය අයකර ගෙන නොතිබුණි.

3.5 කලමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

3.5.1 ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15 ක් මගින් කාන්තා කාර්යාංශ ණය වැඩසටහන යටතේ 2012 – 2022 අතර කාලය තුල ප්‍රතිලාභීන් 524 ක් වෙත අපේක්ෂා ණය වැඩ සටහන යටතේ ලබාදී තිබුණු ණය මුදලින් එකතුව රු.10,633,495 ක් වූ ණය මුදලක් ද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක් මගින් චක්‍රීය ණය වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් 218 ක් වෙත ලබා දී තිබුණු ණය මුදලින් එකතුව රු.1,984,537 ක් වූ ණය මුදලක් ද , ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක් මගින් කාන්තා කාර්යාංශ ණය වැඩසටහන යටතේ 2012 – 2017 අතර කාලය තුල ප්‍රතිලාභීන් 22 ක් වෙත වැන්දඹු ණය වැඩ සටහන මගින් ලබාදී තිබුණු ණය මුදලින් එකතුව රු.180,700 ක් වූ ණය මුදලක් ද සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් අයකර ගෙන නොතිබුණි.

3.5.2 ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන අයවැය චක්‍රලේඛයේ 3.2 ඡේදය ප්‍රකාරව පළාත් සභාවකට නිලධාරීන් ස්ථාන මාරු වී යන්නේ නම් එම පළාත් සභාවෙන් අදාල ණය මුදල් එකවර අයකර ගැනීමට කටයුතු කල යුතු අතර එසේ අයකර ගත නොහැකි නම් මාසික වාරික වශයෙන් හෝ අයකර ගැනීමට කටයුතු කල යුතු වුවද බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවය කර පළාත් සභා ආයතන වලට ස්ථාන මාරුවීම් ලබා ගිය නිලධාරීන් 10 දෙනෙකුගෙන් අයවිය යුතු වසර 05 කට අධික කාලයක සිට පැවත එන රු.653,965 ක ණය ශේෂයන් 2022 දෙසැම්බර් 31 දින වන විටද අයකර ගෙන නොතිබුණි.

3.5.3 හපුතලේ, හාලිඇල හා රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවයේ නිරතව සිට වැඩ තහනමට ලක්වූ නිලධාරීන්/ සේවකයින් දෙදෙනෙකුගේ වසර 05 කට අධික කාලයක සිට පැවත එන රු.125,617 ක ණය ශේෂයන්ද එක් නිලධාරියෙකුගේ වසර 1 – 2 අතර කාලයක් ගතවූ රු.186,800 ක ණය ශේෂයක්ද ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 1.6 හා 4 වගන්තිය අනුව කටයුතු කර අයකර ගෙන නොතිබුණි.

3.5.4 වැලිමඩ හා ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි සේවයේ නියුක්තව සිට සේවය අතහැර ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.295,820 ක ණය ශේෂයක් ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 4.5 වගන්තිය අනුව කටයුතු කර අයකර ගෙන නොතිබුණි.

3.6 විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා නොදීම

2022 දෙසැම්බර් 13 දින නිකුත් කරන ලද අංක බීඩීයූ/ඒ/එම්වයි/2022/40 (ii) දරන විගණන විමසුම සඳහා 2022 අප්‍රේල් 30 වන දින වන විටද පිළිතුරු ලබා දී නොතිබුණි.

4. තිරසර සංවර්ධනය

තිරසර සංවර්ධන අරමුණු ඉටු කිරීමේ ප්‍රගතිය

ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම, පෝෂණය වර්ධනය කිරීම හා තිරසාර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම, සියළු දෙනාටම ජලය සහ සනීපාරක්ෂාව ලැබීමේ අයිතිය හා තිරසාර ජල හා සනීපාරක්ෂාව කළමනාකරණය සුරක්ෂිත කිරීම, සෞඛ්‍ය සම්පන්න ජීවිත සුරක්ෂිත කිරීම සහ සෑම වයස් කාණ්ඩයක් සඳහාම ශාරීර සුවතාව වර්ධනය කිරීම, සියලු ආකාරයේ දිළිඳු බව සියලු තැන්හි ම දුරු කිරීම, පරිසර සංරක්ෂණය යන තිරසර සංවර්ධන අරමුණු වලින් සියයට 85 සිට සියයට 95 ක ප්‍රතිශතයක් සමාලෝචිත වර්ෂයේදී ඉටුකරගෙන නොතිබුණි.

5. යහපාලනය

5.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

5.1.1 ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 ක් වෙත සමාලෝචිත වර්ෂය තුලදී දැව හෙළීම් බලපත්‍ර ලබාගැනීම සඳහා අයදුම්පත් 1296 ක් ලැබී තිබුණු නමුත් වර්ෂය අවසන් වන විට ඉන් 1044 ක් සඳහා පමණක් දැව බලපත්‍ර නිකුත් කර තිබුණි. අයදුම්පත් 252 ක් හෙවත් සියයට 20 කට ආසන්න අයදුම්පත් ප්‍රමාණයක් සඳහා දැව හෙළීම් බලපත්‍ර නිකුත් කර නොතිබුණි. ඒ අනුව මහජනතාව සඳහා කාර්යක්ෂම හා කඩිනම් සේවාවක් ලබාදීමේ අවශ්‍යතාවය පුරවැසි ප්‍රඥප්තිය තුල තහවුරු කර තිබියදී ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි.

5.1.2 සමාලෝචිත වර්ෂය තුලදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 කට අදාලව තනි පුද්ගල ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත් 709 ක් ලැබී තිබුණද 2022 දෙසැම්බර් 31 දින වන විට ඉන් අයදුම්පත් 107 ක් සඳහා ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීම සිදුකර නොතිබුණි.

5.1.3 සමාලෝචිත වර්ෂය තුලදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 කට අදාලව වැලි කැණීම් හා ප්‍රවාහන බලපත්‍ර ලබාගැනීම සඳහා අයදුම්පත් 180 ක් ලැබී තිබුණු අතර ඉන් අයදුම්පත් 31 ක් සඳහා 2022 දෙසැම්බර් 31 දින වන විටත් බලපත්‍ර නිකුත් කර නොතිබුණි.

5.1.4 ජනාධිපති ලේකම්ගේ 2020 සැප්තැම්බර් 15 දිනැති අංක PC/GPA/Circular/29/2020 දරන ජනාධිපති චක්‍රලේඛය අනුව සියළුම රජයේ ආයතනවල නිලධාරීන් මහජන දිනය වන සඳුදා දිනය තුල තම කාර්යාලයේ රැඳී සිටිය යුතු අතර අත්‍යවශ්‍ය කටයුත්තකට හැර එදිනට නිවාඩු ගැනීමෙන් හා කාර්යාලයෙන් පිටත රාජකාරී යොදා ගැනීමෙන් වැලකිය යුතු වුවද ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ක නිලධාරීන්ගෙන් සැලකිය යුතු පිරිසක් සඳුදා දිනය තුල කාර්යාලයේ සේවයට වාර්තා කර නොතිබුණි.

5.2 විගණන හා කළමනාකරණ කමිටුව

2019 ජනවාරි 12 දිනැති කලමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/01-219 හි 5.3 ඡේදය අනුව සෑම අස්ථිත්වයක් විසින්ම විගණන හා කලමනාකරණ කමිටු රැස්වීම අවම වශයෙන් කාර්තුවකට වරක් හෙවත් වර්ෂයකට අවම වශයෙන් 4 ක් වන පරිදි පැවැත්විය යුතු වුවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක් විසින් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි.

6. මානව සම්පත් කලමනාකරණය

අනුයුක්ත කාර්ය මණ්ඩලය හා තථ්‍ය කාර්ය මණ්ඩලය

2022 දෙසැම්බර් 31 දිනට බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15 සඳහා අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු 29 ක පුරප්පාඩු 175 ක් පැවතිණි.

සේවා වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	53	50	03
තෘතියික මට්ටම	48	28	20
ද්විතියක මට්ටම	1170	1029	141
ප්‍රාථමික මට්ටම	141	130	11
එකතුව	1412	1237	175

කේ.එම්.ජයසිංහ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

K.M. Jayasinghe
Senior Assistant Auditor General
National Audit Office
Battaramulla

පිටපත්:- 01. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
02. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

04 පරිච්ඡේදය

කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100%-90%	75%-89%	50%-74%
වැටුප් හා වේතන, රජයේ සේවකයින් සඳහා දේපළ ණය පොලී, වෙනත් දීමනා	✓		
අතිකාල දීමනා හා නිවාඩු දින වැටුප්		✓	
ගමන් වියදම් (දේශීය)	✓		
සැපයීම් (ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා	✓		
සැපයීම් (ඉන්ධන)	✓		
සැපයීම් (ආහාරපාන හා නිල ඇඳුම්)			✓
නඩත්තු වියදම් (වාහන)	✓		
නඩත්තු වියදම් (යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ)	✓		
නඩත්තු වියදම් (ගොඩනැගිලි සහ ඉදිකිරීම්)		✓	
සේවා (තැපැල් හා සන්නිවේදන)	✓		
සේවා (විදුලිය සහ ජලය)		✓	
සේවා (බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු, වෙනත්)		✓	
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම (ගොඩනැගිලි සහ ඉදිකිරීම්)	✓		
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම (යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ)		✓	
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම (වාහන)		✓	
මූලධන වත්කම් අත්පත්කර ගැනීම් (ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ)	✓		
මූලධන වත්කම් අත්පත්කර ගැනීම් (යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ)	✓		
මූලධන වත්කම් අත්පත්කර ගැනීම් (ගොඩනැගිලි සහ ඉදිකිරීම්)			✓
හැකියා වර්ධනය (කාර්යමණ්ඩල පුහුණු)			✓
වෙනත් (ගම සමඟ පිළිසඳරක්, විමධ්‍යගත වැඩසටහන)			✓

05 පරිච්ඡේදය

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරාගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනාගන්නා ලද අදාල තිරසර සංවර්ධන අරමුණු

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

5.1 හඳුනාගන්නා ලද අදාල තිරසර සංවර්ධන අරමුණු

ඉලක්කය/අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේදක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
නම්‍යශීලි යටිතල පහසුකම් සංවර්ධන, තිරසාර හා පරිපූර්ණ කාර්මීකරණය හා නවෝත්පාදනය දිරිමත් කිරීම	යටිතල පහසුකම් ව්‍යාපෘති 1303 ක් ක්‍රියාත්මක කිරීම (මාර්ග, නිලසෙවන, ප්‍රජා ශාලා, සති පොළ)	2022 වර්ෂය තුල නව යටිතල පහසුකම් ව්‍යාපෘති 460 ක් ඉදිකර අවසන්කිරීම			✓
ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම පෝෂණය වර්ධනය කිරීම හා තිරසාර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම	වාරි ව්‍යාපෘති 47 ක් ක්‍රියාත්මක කිරීම	නව වාරි ව්‍යාපෘති 7 ක් ක්‍රියාත්මක කර අවසන් කිරීම			✓
සියළු දෙනාටම ජලය සහ සනීපාරක්ෂාව ලැබීමේ අයිතිය හා තිරසාර ජල හා සනීපාරක්ෂාව කළමනාකරණය සුරක්ෂිත කිරීම	පානීය ජල ව්‍යාපෘති 78 ක් ක්‍රියාත්මක කිරීම	පානීය ජල ව්‍යාපෘති 11 ක් ක්‍රියාත්මක කර අවසන් කිරීම			✓
සෞඛ්‍ය සම්පන්න ජීවිත සුක්ෂිත කිරීම සහ සෑම වයස්කණ්ඩයක් සඳහාම ශරීර සුවතාව වර්ධනය කිරීම	සෞඛ්‍ය මධ්‍යස්ථාන 26 ක් හා ග්‍රාමීය ක්‍රීඩා පිටි 20 ක් ඉදිකිරීම	නව සෞඛ්‍ය මධ්‍යස්ථාන 3 ක් හා ග්‍රාමීය ක්‍රීඩාපිටි 6 ක් සංවර්ධනයකර අවසන් කිරීම			✓
ගොඩබිම් පරිසර පද්ධති තිරසාර ලෙස භාවිත කිරීම, වනාන්තර තිරසාර ලෙස කළමනාකරණය කිරීම , කාන්තාරකරණය වැලැක්වීම හා ඉඩම් අවභාවිතය නැවැත්වීම හා පිළිසකර කිරීම හා ජෛව විවිධත්වය ට හානිවීම නතර කිරීම.	පරිසර සංරක්ෂණ ව්‍යාපෘති 153 ක් ක්‍රියාත්මක කිරීම	පරිසර සංරක්ෂණ ව්‍යාපෘති 7 ක් ක්‍රියාත්මක කර අවසන් කිරීම			✓
සියලු ආකාරයේ දිළිඳු බව සියලු තැන්හිම දුරු කිරීම.	ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති 1855 ක් ක්‍රියාත්මක කිරීම	ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති 116 ක් ක්‍රියාත්මක කර අවසන් කිරීම			✓
	සමාජ සුභ සාධන ව්‍යාපෘති 150 ක් ක්‍රියාත්මක කිරීම	සමාජ සුභ සාධන ව්‍යාපෘති 84 ක් ක්‍රියාත්මක කර අවසන් කිරීම			✓

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

ජයග්‍රහණ

- 2022 වර්ෂයේදී විමධ්‍යගත අයවැය වැඩසටහනේ 53% ක භෞතික ප්‍රගතියක් හා 48% ක මූල්‍ය ප්‍රගතියක් අත්පත් කර ගැනීම
- 2022 වර්ෂයේදී ගම සමඟ පිළිසඳරක් වැඩසටහන යටතේ රු. මිලියන 03 ව්‍යාපෘති, රු.මිලියන 04 ව්‍යාපෘති, රු.මිලියන 20 ව්‍යාපෘති, හා රු.මිලියන 100 ව්‍යාපෘති 37% ක භෞතික ප්‍රතිශතයක් හා 41% ක මූල්‍ය ප්‍රගතියක් අත්පත් කර ගැනීම
- 2022 වර්ෂයේදී ළමුන් සඳහා දිවා සුරැකුම් මධ්‍යස්ථාන ඉදිකිරීම හා ප්‍රජාපාදක සෑදෑ සුරැකුම් මධ්‍යස්ථාන සංවර්ධන වැඩසටහනේ 100% ක භෞතික ප්‍රගතියක් හා 99% ක මූල්‍ය ප්‍රගතියක් අත්පත් කර ගැනීම
- 2022 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට හැකි වූ ව්‍යාපෘතිවලට අදාලව 75% - 100% අතර ප්‍රතිශතයකින් ප්‍රගතියක් අත්කර ගැනීමට හැකි වීම.

අභියෝග

- තිරසර සංවර්ධන අභිමතාර්ථ ඉලක්ක කර, දිසත්‍රික්කයේ ප්‍රමුඛතාවය අනුව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් නොවීම.
- ආර්ථික අර්බුදය හමුවේ 2022/04/26 දිනැති මුදල් අමාත්‍යාංශ චක්‍ර ලේඛය අනුව ප්‍රතිපාදන සීමා කිරීම.

06 පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපා ඇති ආකාරය

6.3 මානව සම්පත් සංවර්ධනය

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

සේවා මට්ටම	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/ (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	53	50	03
තෘතීයික	48	28	20
ද්විතීයික	1170	1029	141
ප්‍රාථමික	141	130	11



6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපා ඇති ආකාරය

- ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 03 ක් පැවතීම නිසා පුරප්පාඩු පැවති කාර්යාලවල රාජකාරි ආවරණයට සහ වැඩබැලීමට නිලධාරීන් යෙදවීමට සිදුවීම හේතුවෙන් එම නිලධාරීන්ගේ වැඩ කොටස් වැඩි වූ අතර, ආයතනයේ නියමිත ඉලක්ක ළඟා කර ගැනීමට එම හේතුව ද යම්තාක් දුරට බාධාවක් විය.

- සෙසු මට්ටම් වල නිලධාරී හිඟයන් සම්පූර්ණ කරගැනීමට නොහැකි වීම මත, ඉන්න නිලධාරීන්ගේ වැඩකොටස් වැඩි වූ අතර, ඒ හේතුවෙන් ඔවුන්ගෙන්ද උපරිම කාර්ය සාධනයක් නොලැබීම.

- කාන්තා නිලධාරීන් වැඩි ප්‍රමාණයක් සිටීම නිසා ප්‍රසූත නිවාඩු යන අවස්ථා වලදී මෙවන් මානව සම්පත් හිඟයක් පැවතීම රාජකාරී ආවරණයට වෙනත් නිලධාරීන් යෙදවීමටත්, ආයතනය නිසි ලෙස පවත්වාගෙන යාමටත් බාධකයක් විය.

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම/ලබාගත් දැනුම*
			දේශීය	විදේශීය		
ග්‍රාම නිලධාරීන් පුහුණු වැඩසටහන (ඉඩම් රාජකාරි/දැව රාජකාරි/ ලිපිගොනු කළමනාකරණය)	518	2022.03.11 දින සිට 2022.03.26 දින දක්වා	407,100.00		දේශීය	• ඉඩම් රාජකාරි, දැව රාජකාරි හා ක්ෂේත්‍ර රාජකාරි කිරීමේදී සිදුවන ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා දැනුම • ලිපිගොනු කළමනාකරණය සඳහා නවතම මෘදුකාංග භාවිතය
කාර්යාල ක්‍රම පිළිබඳ පුහුණුව	25	2022.03.30	5,675.00		දේශීය	• කාර්යාල ක්‍රම වලට අනුකූලව කටයුතු කිරීමේ වැදගත්කම හා අවශ්‍යතාවය පිළිබඳ නිලධාරීන් දැනුවත් කිරීම හා ඒ අනුව කටයුතු කිරීම විධිමත් කිරීම
නවක බහුකාර්ය සංවර්ධන සහායක නිලධාරීන් සඳහා පුහුණුව	50	2022.09.20	15,340.00		දේශීය	• රාජ්‍ය සේවය, රාජ්‍ය නිලධාරීන් යනු කව්රුන්ද, ආයතන සංග්‍රහය පිළිබඳ මූලික දැනුම • රාජ්‍ය සේවයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම හා සේවකයන්ගේ වගකීම් තහවුරු කිරීම
නවක සංවර්ධන සහායක නිලධාරීන් සඳහා පුහුණුව	70	2022.09.22	29,750.00		දේශීය	• කාර්යපටිපාටික රීති, සාමාන්‍ය හැසිරීම හා විනය පිළිබඳ දැනුම • රාජ්‍ය සේවයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම හා සේවකයන්ගේ වගකීම් තහවුරු කිරීම
සංඥා භාෂා දෙදින පුහුණු වැඩසටහන	45	2022.12.01 දින හා 2022.12.02 දින	45,340.00		දේශීය	• සේවාලාභීන් කෙරෙහි මූලික ආගන්තුක සත්කාර, රාජකාරි සැපයීමේදී මූලික කතාබහ යනාදී කරුණු පිළිබඳව නිලධාරීන් දැනුවත් කිරීම • සමාජ අවශ්‍යතාවයක් සේ සලකා විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ට රාජ්‍ය සේවා සැපයීමේදී කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ දැනුම • රාජ්‍ය සේවයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම හා සේවකයන්ගේ වගකීම් තහවුරු කිරීම
පරිගණක පාඨමාලා පුහුණුව	45	2022.12.27	13,345.00		දේශීය	• Introduction/MS-Office/ Internet & email/ Basic of Hardware/Software Installation පිළිබඳ දැනුම

* ආයතනයේ කාර්යසාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන ආකාරය

- ග්‍රාම නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම තුළින් ඔවුන් ඉඩම් රාජකාරි ඉටුකිරීමේදීත්, දැව රාජකාරි ඉටුකිරීමේදීත්, ක්ෂේත්‍ර රාජකාරිවල නියුක්ත වීමේදීත් පොදුවේ ඇතිවන ගැටලු නිරාකරණය කරගන්නේ කෙසේද යන්න පිළිබඳ දැනුවත් වීම තුළින් එම රාජකාරි වඩාත් නිවැරදිව හා අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව කළ හැකි වීම හා ඒ තුළින් රාජ්‍ය සේවාවන්හි ගුණාත්මකභාවය වැඩිවීමත්, හොඳ මහජන සම්බන්ධතාවයක් ගොඩනැඟීමත් සිදුවීම.

- කාර්යාල ක්‍රම පිළිබඳ නිලධාරීන් දැනුවත් කිරීම මඟින් කාර්යාල ක්‍රම වලට අනුකූලව කටයුතු කිරීම විධිමත් කිරීම හා ඒ තුළින් කාර්යාල කටයුතු වඩාත් කාර්යක්ෂම කිරීම හා නිලධාරීන් තම අභිමතය පරිදි කටයුතු කිරීම් වැලැක්වීම.

- නවක බහුකාර්ය සංවර්ධන සහායක නිලධාරීන්ට රාජ්‍ය සේවය යනු කුමක්ද, රාජ්‍ය නිලධාරියා යනු කවරෙක්ද, ආයතන සංග්‍රහය පිළිබඳ මූලික හැඳින්වීමක් ලබාදීම තුළින් ඔවුන් රාජ්‍ය සේවයට ගුණාත්මකව සම්බන්ධ කිරීම හා ඒ තුළින් රාජ්‍ය සේවාවන්හි ගුණාත්මකභාවය ඉහළ නැංවීම.

- නවක සංවර්ධන නිලධාරීන් සඳහා කාර්ය පටිපාටික රීති, සාමාන්‍ය හැසිරීම හා විනය පිළිබඳ දැනුම ලබාදීම තුළින් ඔවුන් රාජ්‍ය සේවයට ගුණාත්මකව සම්බන්ධ කිරීම හා රාජ්‍ය සේවයේ නීතිරීති, රෙගුලාසි හා ක්‍රමවේදයන් පිළිබඳ අවබෝධය ලබාදීම මඟින් රාජ්‍ය සේවයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම.

- සංඥා භාෂා පුහුණුව නිලධාරීන්ට ලබාදීම මඟින් සමාජ අවශ්‍යතාවයක් සේ සලකා විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ට සේවාවන් සැපයීමේදී එම කටයුතු වඩාත් කාර්යක්ෂමව හා පහසුවෙන් කළ හැකිවීම.

- පරිගණක භාවිතය පිළිබඳ කාර්යාල කටයුතු වලදී වැදගත් වන MS-Office/ Internet & email/ Hardware & Software Installation පිළිබඳ දැනුම ලබාදීම මඟින් කාර්යාල කටයුතු කාර්යක්ෂම කිරීමත්, සේවාවන් ගුණාත්මක කිරීමත්, උපකරණ නිවැරදිව භාවිතා කිරීම තුළින් උපකරණවල නඩත්තු කටයුතු අවම කිරීම.

07 පරිච්ඡේදය

අනුකූලතා වාර්ථාව

7.1 අනුකූලතා වාර්තාව

7.1 අනුකූලතා වාර්තාව

අංශය	අදාළකර ගතයුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)		අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**				
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ			
1.2	වෙනත්	අදාල නොවේ			
2	**පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම(මු.රෙ.445)**				
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනයයාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ			
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ			
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ			
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ			
2.5	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ			
2.6	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ			
2.7	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ			
2.8	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ			
2.9	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ			
2.10	උපපත්‍රිකා පොත් ලේඛනය (GAN-20)යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ			

අංකය	අදාළකර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)		අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම(මු.රෙ/115)**				
3.1	මූල්‍ය බලතල ආයතනය තුල බලතල පවරා දී තිබීම	අනුකූල වේ			
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳව ආයතනය තුල දැනුවත් කිරීම	අනුකූල වේ			
3.3	ආයතනය තුල සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩිසංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ			
3.4	2014.05.11 දිනැති අංක 171/2007 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයඅනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරවරයන්ගේ පාලනයටයටත්ව කටයුතු කිරීම	අනුකූල වේ			
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**				
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලස්ම සකස් කිරීම	අනුකූල වේ			
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලස්ම සකස් කිරීම	අනුකූල වේ			
4.3	සමාලෝචිත වර්ෂය සඳහා 1971 අංක 38 දරණ මුදල් පනත ප්‍රකාරව අයවැය අනුමත කරගෙන තිබීම	අනුකූල වේ			
4.4	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලස්ම සකස් කිරීම	අනුකූල වේ			
4.5	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැයදෙපාර්තමේන්තුවට(NBD) නියමිත දිනටඉදිරිපත් කිරීම	අනුකූල වේ			
4.6	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිතදිනට භාණ්ඩාගාර මෙහෙයුම්දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ			

ඡේදය	අදාළකරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)		අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
4.7	කාර්තු වාර්තා නියමිත දිනට මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ			
5	**විගණන විමසුම්**				
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම		අනුකූල නොවේ	ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ලබාදෙන ලද පිළිතුරු ප්‍රමාදවීම	
6	**අභ්‍යන්තර විගණනය**				
6.1	මු.රෙ.134 (2)DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟසාකච්ඡා කිරීමෙන් අනතුරුව,අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ			
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුලදී පිළිතුරු සපයා තිබීම		අනුකූල නොවේ	ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ලබාදෙන ලද පිළිතුරු ප්‍රමාදවීම	
6.3	2018 අංක 19 දරණ ජාතිකවිගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වලපිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවටඉදිරිපත් කර තිබීම	අනුකූල වේ			
6.4	මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවලපිටපත් විගණකාධිපතිට ඉදිරිපත් කිරීම	අනුකූල වේ			

අංශය	අදාළකර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)		අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
7	**විගණන හා කළමනාකරණ කමිටු**				
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 4 ක් වත් අදාල වර්ෂය තුල පවත්වා ගෙන තිබීම	අනුකූල වේ			
8	**වත්කම් කළමනාකරණය**				
8.1	අංක 1/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 7 වන පරිච්ඡේදය අනුවවත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල්කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ			
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේවිධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකුපත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයටවාර්තා කර තිබීම	අනුකූල වේ			
8.3	රාජ්‍ය මුදල් චක්‍ර ලේඛ අංක 5-2016 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාල වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ			
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත,ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුල සිදු කොට තිබීම	අනුකූල වේ			
8.5	ගර්භිත භාණ්ඩ අපහරණය කිරීම මු.රේ.772 අනුව සිදු කිරීම	අනුකූල වේ			

අංකය	අදාළකර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)		අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
9	**වාහන කළමනාකරණය**				
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොටනියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ			
9.2	වාහන ගර්හිත වී මාස 6 කට වඩා අඩු කාලයේදී අපහරණය කර නිබීම		අනුකූල නොවේ	මූලික පරීක්ෂන කටයුතු අවසන් නොවීම හා නඩු කටයුතු අවසන් නොවීම	
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත් කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ			
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109 හා 110 ප්‍රකාරවකටයුතු කිරීම	අනුකූල වේ			
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ			
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතියපවරාගෙන නිබීම	අනුකූල වේ			
10	**බැංකු ගිණුම් කළමනාකරණය**				
10.1	නියමිතදිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කරනිබීම	අනුකූල වේ			

ඡේදය අංකය	අදාළකර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)		අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
10.2	සමාලෝචිත වර්ෂයේදීහෝ ඊටපෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ			
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූහා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන්මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල වේ			
11	**ප්‍රතිපාදන උපයෝජනය**				
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒ වායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම්දැරීම	අනුකූල වේ			
11.2	මු.රෙ.94(1) ප්‍රකාරව,සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂඅවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ			
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**				
12.1	සීමාවන්වලට අනුකූලවීම	අනුකූල වේ			
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූලවේ			
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම		අනුකූල නොවේ	උඟව පළාත් සභාව වෙතින් නිරවුල් කර නොතිබීම	
13	**පොදු තැන්පත් ගිණුම**				
13.1	කල් ඉකුත් වූ තැන්පත් සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙනයාම	අනුකූල වේ			
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ			

ක්‍රියා පටිපාටිය	අදාළකර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)		අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
13	**පොදු තැන්පත් ගිණුම**				
13.1	කල් ඉකුත් වූ තැන්පත් සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙනයාම	අනුකූල වේ			
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ			
14	**අග්‍රිම ගිණුම**				
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම්දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ			
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්යඅවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල වේ			
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරුඅග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ			
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ			
15	**ආදායම් ගිණුම**				
15.1	අදාල රෙගුලාසි වලට අනුකූලව, රැස්කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොටනිබීම	අනුකූල වේ			
15.2	රැස්කළ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කරනිබීම	අනුකූල වේ			
15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කරනිබීම	අනුකූල වේ			

අංශය	අදාළකර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)		අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
16	**මානව සම්පත් කළමණාකරය**				
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුල කාර්ය මණ්ඩය පවත්වාගෙන යාම	අනුකූලවේ			
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ			
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුමවාර්තා කළමණාකරණසේවා දෙපාර්තමේන්තුවෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ			
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**				
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකුපත් කොටතොරතුරු ලබා දීමේ ලේඛනයක්යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ			
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ්අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පලකිරීමට පහසුකම් සලසා තිබීම		අනුකූල නොවේ	ශ්‍රී.තො.තා. නියෝජිත ආයතනය විසින් ලබා දී ඇති වෙබ් අඩවියේ ඒ සඳහා පහසුකම් සලසා නොතිබීම	
17.3	තොරතුරු දැන ගැනීමේ පනත 8 වන හා 10 වන වගන්ති ප්‍රකාර වසරකටදෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ			

අංකය	අදාළකර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)		අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**				
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමණාකරණඅමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොටක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ			
18.2	එම චක්‍ර ලේඛයේ 2.3 ඡේදය පරිදි ,පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක්සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනවිසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ			
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**				
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 2/2018 ඇමුනුම 02 ආකෘතියපදනම් කර ගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ			
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කටනොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුල තහවුරු කොට තිබීම	අනුකූල වේ			
19.3	ඉහත සඳහන් චක්‍ර ලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කර ගෙනසමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ			

ඡේදය අංකය	අදාළකර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)		අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
19.4	ඉහත චක්‍ර ලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්මපිළියෙල කිරීම,ධාරිතා සංවර්ධන වැඩසටහන් හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කර තිබීම	අනුකූල වේ			
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**				
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපතිවිසින් නිකුත් කළ විගණන ඡේද මගින්පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ			